**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

---------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 23 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 11 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 20 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ)** සමාලෝචිත වර්ෂයේදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සභාව වෙත ලබාදුන් ගැල්වනයිස් බට 784 ක වටිනාකම රු.868,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**(ආ)** 2014 දෙසැම්බර් 31 දිනට අතැති තොගවල වටිනාකම රු.838,267 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.3,713,385 ක් ලෙස රු.2,875,118 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**(ඇ)** මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.217,150 ක් විය.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.12,091,160 ක් වූ වත්කම් හා වගකීම් විෂයන් 03 ක් සම්බන්ධයෙන් අයිතිය තහවුරු කිරීමේ ලියවිලි/විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් ඌණතාවය රු.551,007 ක්වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.10,569,980 ක් විය.

**2.2. ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරුතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රවාහය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.000 | රු.'000 |
| (i). | වරිපනම් හා බදු | 1,769 | 2,643 | 3,244 |
| (ii). | බදු කුලී | 5,468 | 5,343 | 6,080 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 3,282 | 3,329 | 169,940 |
| (iv). | වෙනත් ආදායම් | 14,685 | 16,622 | 3,899 |

**2.2.2 හිඟ කඩකුලී**

**---------------**

**සමාලෝචිත වර්ෂය අවසාන** වනවිට හිඟ කඩකුලිය රු.5,006,675 ක් වු අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 හිඟ වරිපනම් බදු**

**--------------------**

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට හිඟ සමුච්චිත වරිපනම් බදු රු.3,243,529 ක්වූ අතර එම හිඟ බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.4 වෙළඳ බලපත්‍ර ගාස්තු

--------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ ලියාපදිංචි කළ හෝටල් සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු අය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

**3.1.1 ඉඩම් හා ගොඩනැගිලි පවරා නොගැනීම**

**-------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අක්කර 15 යි රූඩ් 09 ක්වූ ඉඩම්වල අයිතිය පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 03 හි විධිවිධාන පරිදි සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.1.2 සුසාන භූමි**

**-------------**

1995 ඔක්තෝම්බර් 06 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ පලකර තිබුණු පරිදි සභා බල ප්‍රදේශය තුල පිහිටි සුසාන භූමි සම්බන්ධයෙන් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 9 හි යෝජනා හා නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**4. පද්ධති හා පාලනය**

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පරිපාලනය.

**(ඇ)** වත්කම් කළමනාකරණය